

1

## 1.1 විශේෂාංග රූප සටහන්
## දේශීය ඉන්ධන අලෙවියෙහි සහ මිල ගණන්වල ප්‍රවණතා




මූලය: දේශීය ඉන්ධන අලෙවිකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

2022-2024 කාලය තුළ දී පෙට්‍රල් 90/92 සහ සුදු ඩීසල් විකුණුම් පරිමාව සහ දේශීය සිල්ලර මිල අතර සම්බන්ධතාවය රූප සටහන් මගින් නිරූපණය කෙරේ. 2022 වසරේ මැද භාගයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිතවල ගෝලීය මිල ගණන් ඉහළ යෑමත්, මිල සූත්‍රය පදනම් කරගත් මිල නියම කිරීමේ ක්‍රමවේදය ක්‍රියාවට නැංවීමත් සමඟ ඉන්ධන වර්ග දෙකෙහි ම මිල තියුණු ලෙස ඉහළ ගියේය. ආර්ථික අර්බුදය පැවති කාලපරිච්ඡේදය තුළ දී දේශීය මිල ගණන් ඉහළ යෑම, ඉන්ධන සලාක වශයෙන් නිකුත් කිරීම සහ මන්දගාමී ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් විකුණුම් පරිමාවට බලපෑම් ඇති විය. මෙම වර්ධනයන්හි ඒකාබද්ධ බලපෑම හේතුවෙන්, එම කාලය තුළ දී දේශීය වෙළෙඳපොළේ ඛනිජ තෙල් නිෂ්පාදිතවල සමස්ත විකුණුම් පරිමාව තියුණු ලෙස පහළ ගියේය.

අර්බුදයෙන් පසුව, ගෝලීය සහ දේශීය මිල ගණන් ස්ථාවර වී, දේශීය ඉන්ධන සැපයුම යථා තත්ත්වයට පත් වුව ද, සමස්ත ප්‍රවණතාවලින් පෙනී යන ආකාරයට ඉහළ ඉන්ධන මිල ගණන් විකුණුම් පහළ යෑමටත්, පහළ ඉන්ධන මිල ගණන් විකුණුම් ඉහළ යෑමටත් හේතු වන අතර, එමගින් මිල උච්චාවචනයන්ට වෙළෙඳපොළ සංවේදී වන බවත්, පාරිභෝගික ඉල්ලුමෙහි වෙනස්වීම් සිදු විය හැකි බවත් ඉස්මතු කෙරේ. මේ අනුව, අහිතකර ලෙස ගෝලීය භාණ්ඩ මිල වෙනස් වන අවස්ථාවන්හි දී රටට ඇතිවන අයහපත් බලපෑම් අවම කිරීම සඳහා පිරිවැය පාදක මිලකරණය උපකාරී වේ.